ජාතික ජලජ සම්පත්
නියෝජිතායතනය

தேசிய நீரியல்வள தொளைம

# NATIONAL AQUATIC RESOURCES AGENCY

# 1987

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்கும்

## ANNUAL REPORT AND ACCOUNTS

## 1.0 සමුද්‍රීය ජීව විද්‍යාත්මක සම්පත් අංශය

### 1.1 සේවක මණ්ඩලය

සමාලෝචනයට ලක්වන කාල පරිච්ඡේදය තුලදී සමුද්‍රීය ජීව විද්‍යාත්මක සම්පත් අංශය පරියේෂණ නිලධාරීන් 7ක්, පරියේෂණ සහායකයන් 5 ක්, විද්‍යාගාර සේවකයන් 3 ක් සහ (තාවකාලික පදනම මතවූ) එක් යතුරුලේඛකයෙකුගෙන් යුක්ත ස්ථාවර කාර්යමණ්ඩලයක් සහිතව කටයුතු කලේය. ඒකකයේ භාරය භාර නිලධාරියා 1987 මැයි 21 වන දින නාරා ආයතනයේ සේවය හැර ගිය අතර, 1987 ජූනි 01 වනදින ඔහුගේ අනුප්‍රාප්තිකයා පත් කරනු ලැබීය.

" සමුද්‍ර මාරි " පරියේෂණ යාත්‍රාවේ සමුද්‍රීයජීව විද්‍යාත්මක වැඩ කටයුතු කරගෙන යාමට 1987 අප්‍රියෙල් මාසයේදී එක් අභ්‍යාසලාභී පරියේෂණ සහකරුවක් කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගනු ලැබුනි. ඔහු 1987 ඔක්තොම්බර් මසදී නිලයෙන් ඉල්ලා අස්විය. 1987 නොවැම්බර් 01 වන දින සිට තාවකාලික දත්ත රැස්කරන්නන්හතරදෙනෙකු පත්කරන ලදී.

### 1.2 කාර්ය වැඩ සටහන

1987 වර්ෂයතුලදී පහත සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදී.

1.2.1 නාරා මඟින් අරමුදල් සපයන ව්‍යාපෘති
1.2.1.1 කෙලවල්ලන් ධීවර කර්මාන්ත අධ්‍යයනය
1.2.1.2 සුළු පරිමාණයෙන්දියඹ මසුන් ඇල්ලීමේ පිලිබඳ අධ්‍යයනය.
1.2.1.3 ඉස්සන් ධීවර කර්මාන්තය
1.2.14 පොකිරිස්සන් ධීවර කාර්මාන්තය
1.2.1.5 "සමුද්‍ර මාරිය" පරියේෂණ යාත්‍රාවේ සමුද්‍රීය ජීව විද්‍යාත්මක කාර්යයන්.
1.2.2 විදේශීය/වෙනත් ග්‍රාමීය නියෝජිත ආයතන මඟින් අරමුදල් සපයන ව්‍යාපෘති
1.2.2.1 ආ.කෘ.ස/නාරා මඟින් ශ්‍රී ලංකාවේ ගවේෂණාත්මක වශයෙන් කෙලවල්ලන් ඇල්ලීමේකර්මාන්තය

1.2.2.2.2 ඉ.පැ.කා.වැ./නාරා මඟින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය ආදර්ශණ වැඩ සටහන

### 1.2.1 නාරා ආයතනයේ අරමුදල්ගත් ව්‍යාපෘතීන්

#### 1.2.1.1. කෙලවල්ලන් ධීවර කර්මාන්ත අධ්‍යයනය

කල්පිටියසිට කිරින්ද දක්වා වූ ප්‍රදේශය ආවරණය කරනලද අතර, ප්‍රධාන මත්ස්‍ය වර්ගයන් සඳහා වන ධීවර කර්මාන්ත අධීක්ෂණය සහ ජීව විද්‍යාත්මක විමර්ශණයන් තවදුරටත් කරගෙන යන ලදී. ප්‍රධාන මත්ස්‍ය ගොඩබාලස්ථාන 12 සිට 14 ක් ක්ෂෙත්‍ර සංචාරයන් තුලදී ආදර්ශණය කරනලද අතර, ඒවා ක්ෂෙත්‍ර සංචාරයන් සාමාන්‍යයෙන් සෑමඋප ප්‍රදේශයකම එක් මසකට දින 4-6 ක් දක්වා කාල සීමාවක වනසේ සිදුකෙරේණ. ඉ.පැ.කෙ.වැ.දත්ත එකතු කරන්නන් මෙම වැඩබිම්වල ස්ථානගත කල බැවින් මෙම වර්ෂයේ ජනවාරි සිට මීගමුව සහ බේරුවල ආදරශණ සූක්ෂමතාව පහත වැටුනි. නොවැම්බර් මස සිට දකුණේ දත්ත රැස්කිරීම සඳහා තවත් දත්ත එකතුකරන්නන් හතරදෙනෙකු සේවයට බඳවාගත් අතර, නිසා දකුණේ ආදර්ශණ වැඩසටහන නාරා ආයතනයේ නිලධාරීන් විසින් ක්‍රියාත්මක නොකෙරුණි. කෙසේ නමුත් මෙම දත්ත එකතුකරන්නන් පුහුණු කිරීම සහ අධීක්ෂණය නාරා ආයතනයේ නිලධාරීන් විසින් දෙසැම්බරයේ දී ඉටුකරන ලදී.

1.2.1.2 <u>සුළු පරිමාණයෙන් දියඹ මසුන් ඇල්ලීමේ පිලිබඳ අධ්‍යයනය</u>

වයඹ දිග කල්පිටියේ සිට දකුණු දිග කිරින්ද තෙක්වූ සුළු පරිමාණ දියඹ මත්ස්‍ය ධීවර කර්මාන්තයන් අධ්‍යයනය කරනු ලැබීය. ප්‍රධාන ධීවර කර්මාන්තයන් තුනක් එනම් නිරිත දිග වෙරළට ඔබ්බෙන් මෙහෙයවන ලද කුඩා ඇයි සහිත කරමල් දිල ධීවර කර්මාන්තය, මාදැල් ධීවර කර්මාන්තය හා ඔැඹිලිදැල් ධීවර කර්මාන්තය. බටහිර සහ වයඹ දිග වෙරෙලේ වර්ෂය මුළුල්ලේම පාහේ කරමල්දැල් ධීවර කර්මාන්තය මෙයෙයවීම සිදුවිනි.

1987 සැප්තැම්බර් සිට ඉ.පැ.කෙ.වැ. මඟින් සේවයට බඳවා ගන්නා ලද ආදර්ශකයන්ගේ ආධාරයෙන් ඇතිව වයඹදිග බටහිර හා නිරිතදිග වෙරළවල කෙරෙුණ ආදර්ශණවල සූක්ෂමතාවය වැඩ කරගතහැකි විය. දකුණේ ඇඩා දියඹ ධීවර කර්මාන්තය පිලිබඳ දත්ත සමඟ කෙලවල්ලන්ගේ ද දත්ත රැස්කිරීමේ වැඩ කටයුතු සඳහා 1987 නොවැම්බරයේදී තවත් ආදර්ශකයන් සතරදෙනෙකු සේවයට බඳවා ගනු ලැබුනි.

1.2.1.3 <u>ඉස්සන් ධීවර කර්මාන්තය</u>

මීගමුව සහ හලාවත ඉස්සන් ධීවර කර්මාන්තය අධීක්ෂණයෙහිලා පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙක් යෙදී සිටියහ. පසුගිය වර්ෂයේදී මෙන්ම ජනවාරි සිට ජාර්තු දක්වා කාලය මාළු හිඟ වකවානුවක් වූ අතර, යාත්‍රාවලින් වැඩි ප්‍රමාණයක් වරල් මත්ස්‍ය ධීවර කර්මාන්තය සඳහා යොමු කරනු ලැබුනි. ජූලි සිට සැප්තැම්බර් දක්වාවූ කාල පරිච්ජේදය සඳහා ලොකු ඉස්සන් ඇල්ලීමේ ප්‍රමාණය (දිනකට බෝට්ටුවකට කි.ග්‍රෑ.03ක) ඉතා පහළ අගයක් පෙන්නුම් කල අතර, එය පසුගිය වර්ෂයේ එම කාලපරිච්ජේදයේදී වාර්තාගත ප්‍රමාණයන්ට ද වඩා අඩු මට්ටමක විය. අල්ලන ලද ලොකු ඉස්සන් වර්ගවලට ප්‍රධාන වශයෙන් <u>පිනායෙස් සෙමිසල්කේටස්</u> සහ <u>පිනායෙස් ප්‍රින්ඩිකුස්</u> අයත් අයත් වූ අතර, කුඩා ඉස්සන් වර්ගවලට <u>පී සිටයිලිජේරා</u> සහ <u>මෙටපෙනායුස් ඩොබ්සෝනප</u> අයත්විය.

1.2.1.4 <u>පොකිරිස්සන් ධීවර කර්මාන්තය</u>

මෙම අධ්‍යනයෙහිලා එක් පර්යේෂණ නිලධාරියකු නිරත වී සිටියි. පොකිරිස්සන් ගොඩබෑමේ මධ්‍යස්ථාන ගණනාවක් එනම්, ගාල්ල, දෙවුන්දර, තංගල්ල, තලාම්පිටිය, වෙලිපටන්විල, හම්බන්තොට සහ කිරින්ද ආදර්ශණය සඳහා තෝරාගන්නා ලදී.

දෙසතියකට වරක් දින 4 -5 දක්වා කාලයකට අයත් සංචාරයන් අධ්‍යයන ප්‍රදේශයට මෙහෙයවනු ලැබ ඇත. 1987 දී ප්‍රයත්න ඒකකයකට නිෂ්පාදන අගයන්, 1986 එම මාසයන් සඳහා අල්ලාගන්නා ලද මසුන් හා සැසඳී විට පසුබෑමක් පෙන්වූයේ 1986/1988 අවධිය සඳහා වඩා අඩු මුළු නිෂ්පාදනයක් ද දක්වමිනි. දකුණේ ආරක්ෂක හේතූන් නිසා නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ආදර්ශණ වැඩ සටහන් ක්‍රියාත්මක නොවීය.

1.2.1.5 <u>සමුද්‍ර මාරු" පර්යේෂණ යාත්‍රාවේ සමුද්‍ර ජීව විද්‍යාත්මක වැඩ කටයුතු</u>

1987 මැයි 25 සිට 28 දක්වා වූ දින 4ක මුහුදු ගමනකදී පර්යේෂණ සහායකයන් දෙදෙනෙක් සමුද්‍ර ජීව විද්‍යාත්මක කාර්යයන්වලට සහභාගිවිය. "සමුද්‍ර මාරු 16 නම් මුහුදු ගමන් වාර්තාව පිලියෙල කරනලදී.

1.2.2 <u>විදේශීය/වෙනත් දේශීය නියෝජිත ආයතන මඟින් අරමුදල් සපයන ව්‍යාපෘති</u>

1.2.2.1 ආ.කෘ.ස/නාරා මගින්සිදුකෙරෙන ශ්‍රී ලංකාවේ ගවේෂණාත්මක කෙලවල්ලන් ධීවර කර්මාන්තය.

මෙම වර්ෂයතුලදී මසුන් ඇල්ලීමේ ගමන්වාර 37 ක් අනන්‍ය ආර්ථික කලාපීය මායිම දක්වා මෙහෙයවා ඇත. ඊගමුව සිට ගාල්ල දක්වා බෝට්ටු ක්‍රියාත්මක වූ අතර, බටහිර සහ දකුණු දිග වෙරළවල ගවේෂණාත්මක කෙලවල්ලන් ඇල්ලීම සිදුකෙරුණි. ආරම්භක වශයෙන් මෙම සමීක්ෂණය එක් අවුරුදු කාලයක් සඳහා සැලසුම් කරන ලදී.

1.2.2.2. ඉ.පැ.කෙ.වැ./නාරා මගින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය ආදර්ශණ වැඩසටහන : ඉන්දියානු - ශාන්තිකර කෙලවල්ලන් වැඩ සටහන සහ නාරා ආයතනය හවුල්ව කෙලවල්ලන් කෙලවල්ලා හැඩැති මසුන්, සහ කුඩා දියඹ මසුන් සඳහා මත්ස්‍ය ආදර්ශණ වැඩ සටහනක් දිවයිනේ වයඹ, බටහිර, නිරිත සහ දකුණු දිග වෙරළවල මසුන් ගොඩබාන වැඩබිම් පහකදී ක්‍රියාත්මක කලහ.

මෙම තාවකාලික දත්ත එකතු කරන්නන්ගේ වැඩ කටයුතුවල අධීක්ෂණය සහ පුහුණුවීම මේ ඒකකයේ නිලධාරීන් විසින් සිදු කරන ලදී. මෙම දත්ත එකතුකරන්නන් සියළුම වැදගත් කෙලවල්ලන් වර්ගවල සහ කුඩා දියඹ මසුන්ගේ අල්ලාගත්/පරිශ්‍රම දත්ත හා දිග මනින මිනුම් රැස්කරගත්හ.

1.3 <u>කාර්ය මණ්ඩල පුහුණුවීම</u>

1.3.1 සී.අමරසිරි මහත්මිය 1987 පෙබරවාරි සිට 1987 අප්‍රියෙල් දක්වා ස්ක්‍රිප්ස් සමුද්‍ර විද්‍යා ආයතනයේදී ත්‍රෛයිපාසික එ.ජා.ස.වැ.ශිෂ්‍යත්වයක නියුක්තව සිටියාය.

1.3.2 සී.ජයවික්‍රම මහත්මිය නෝර්වේ බ(ර්)ජේන් විශ්ව විද්‍යාලයෙහි ජීව විද්‍යාත්මක ධීවර කර්මාන්ත පිළිබඳ දස මසක ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීමෙන් පසු 1987 ජූනි මාසයේදී ආපසු පැමිණියාය.

1.3.3 සී.අමරසිරි මහත්මිය බැන්ගලෝර්හි වේල්ස් විශ්ව විද්‍යාලයේ ජීව විද්‍යාත්මක ධීවර කර්මාන්ත පිළිබඳ ඇයගේ පූර්ව උපාධි අධ්‍යයනයක් කරගෙනයාම පිණිස එක්සත් රාජධානිය බලා පිටත්වූවාය.

1.4 <u>ග්‍රාමීය සහ විදේශීය සංස්කාරක මණ්ඩලය හා වැඩමුළුවල කාර්ය මණ්ඩල සහභාගීත්වය:</u>

1.4.1 දොස්තර පී.දයාරත්න මහත්මිය අහුන්ගල්ල ට්‍රිටොන් හෝටලයේ පැවති කෘෂිකාර්මික සැලසුම් කිරීම පිළිබඳ වැඩ මුළුවට සහභාගිවූවාය.

1.4.2 දොස්තර පී.දයාරත්න මහත්මිය කොළඹ ශ්‍රී.වි.ස. ශ්‍රවණාගාරයේදී පැවැති "ශ්‍රී ලංකාවේ සත්ව වර්ගයන්ගේ වාර්ගික දැනුමේ වාර්තමොන තොරතුරු" පිළිබඳ වූ සංස්කාරක සම්මේලනයට සහභාගිවූවාය.

1.4.3 දොස්තර පී.දයාරත්න මහත්මිය කොළඹ කෘෂි පර්යේෂණ පුහුණු ආයතනයේ පැවති "ශ්‍රී ලංකාවේ සමුද්‍රාසන්න උරුමය" පිළිබඳ සංස්කාරක සම්මේලනයට සහභාගිවූවාය.

1.4.4 දොස්තර පී.දයාරත්න මහත්මිය සහ එම්.මොයියාඩීන් (පර්යේ.නිල.) කොළඹ පැවති කුඩා කෙලවල්ලන්, තෝර මසුන් සහ පිළිබඳව ඉ.පැ.කා.වැ. වැඩ මුළුවට සහභාගිවූහ.

1.4.5 දොස්තර පී.දයාරත්න මහත්මිය කොළඹ යුරෝපීය ආර්ථික කමිටුවේ 9 වැනි හමුල් කොමිෂන් රැස්වීමට සහභාගිවූවාය.

1.4.6 ඩී.එස්.ජයකොඩ (පරි.නිල.) මොරටුව ආතර් සී.ක්ලාක් මධ්‍යස්ථානයේදී පැවැත්වූ " දුරස්ථ සංවේදනය" පිළිබඳ පුහුණු පාඨමාලාවකට සහභාගිවූයේය.

1.4.7 ඩබ්.පී.එන්.කරුණාසිංහ (පරි.නිල.) බො.බො.වැ. මහින්සංවිධානය කරනලද සති 2 ක පරිගණක වැඩ මුළුවකට සහභාගිවූයේය.

1.5 <u>ප්‍රකාශන පත්‍රිකා කියවීම සහ වෙනත් වාර්තා හා සේවයන්</u>

1.5.1 දයාරත්න පී. ශ්‍රී ලංකාවේ යසෙු සෙපාලෙෝපෝඩ්ස් පිළිබඳ වාර්ගීකරණ දැනුමේ වර්තමාන තොරතුරු ශ්‍රී ලංකාවේ සත්වයන් වර්ගීකරණ විද්‍යාවේ වර්තමාන තොරතුරු පිළිබඳ සංස්කාරක සම්මේලනයේ ක්‍රියාවලින් ශ්‍රී.වි.ස. අංශය, දිනය 1987 ජූනි 20

1.5.2 දයාරත්න පී. ශ්‍රී ලංකාවේ නිරිත දිග වෙරළේ හැඹිලි දැල් ධීවර කර්මාන්තය 1987 ශ්‍රී.වි.ස. 43 වැනි වාර්ෂික සැසිවාරයේ දී පත්‍රිකාව කියවීම.

1.5.3 දයාරත්න පී. සාඩිනෙල්ලා ගිබෝසා ධීවර කර්මාන්තය සහ ජීව විද්‍යාව පිළිබඳ සමහර ගවෙ සමහර ගවේෂණයන් නාරා ප්‍රකාශනය මුද්‍රණයේ ඇත.

1.5.4 දයාරත්න පී.රූපමිතික ලක්ෂණ යොදාගැනීම මගින් මීගමුව සහ මිලාව ප්‍රදේශවල සැමන් තොග (ඇම්බ්ලිගැස්ට (ර්) ස (ර්)ම් හඳුනාගැනීම. නාරා ප්‍රකාශනය (මුද්‍රණයේ)

1.5.5 දයාරත්න පී. ඇම්බ්ලිගැස්ට (ර්) ස (ර්)ම් හි කරමල් දැල් තෝරා ගැනීම. (ආසියානු ධීවර කර්මාන්ත සඟරාවේ ප්‍රකාශනය සඳහා ඉදිරිපත් කොට ඇත.)

1.5.6 ජයකොඩි ඩී.එස්.සහ එස්.ජේ.සී.ජයවික්‍රම මීගමුවේ ඉස්සන් ධීවර කර්මාන්තය පිළිබඳ තොරතුරු. 1987 ශ්‍රී.වි.ස. 43 වැනි වාර්ෂික සැසිවාරයේදී පත්‍රිකාව කියවීම.

1.5.7 ජයකොඩි ඩී.එස්.පතනන්ගාල්ලේ කටු සහිත පොකිරිස්සන් ධීවර කර්මාන්තය පිළිබඳ තො රතුරු.

1987 ශ්‍රී.වි.ස. 43 වැනි වාර්ෂික සැසිවාරයේදී පත්‍රිකාව කියවීම.

1.5.8 ජයකොඩි ඩී.එස්. ශ්‍රී ලංකාවේ බටහිරි වෙරළෙන් රැස්කරගත් දත්ත මත ඉන්දියානු කැනිස්සන්ගේ (පී.ඉන්ඩිකුස්) ජනගහනය වැඩිවීමේ වේගයන්. ආසියානු ධීවර කර්මාන්ත සඟරාව (මුද්‍රණයේ.

1.5.9 ජයවික්‍රම එස්.ජේ.සී.සහ ඩී.එස්.ජයකොඩි 1982 සැප්තැම්බර් සිට 1986 ජූනි දක්වා කාලයේ මීගමුවේ සහ ඩිලාබ් පිනයියුස් ඉන්ඩිකුස්ගේ (එච්.මිල්නි එඩ්වඩ්ස්) ජනගහනය වැඩිවීමේ වේගපරාමිත 1987 ශ්‍රී.වි.ස. 43 වැනි වාර්ෂික වාර්ෂික සැසිවාරයේ දී පත්‍රිකාව කියවීම.

1.5.10 කරුණාසිංහ ඩබ්.පී.එන්.මොරටුව සහ බේරුවල අතර, ප්‍රදේශයේ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය පිළිබඳ තොරතුරු.
1987 ශ්‍රී.වි.ස 43 වැනි වාර්ෂික සැසිවාරයේදී පත්‍රිකාව කියවීම.

1.5.11 කරුණාසිංහ, ඩබ්.පී.එන්. සහ පී.දයාරත්න ශ්‍රී ලංකාවේ බටහිර සහ දකුණු දිග වෙරළවල කුඩා දියඹ මත්ස්‍ය ධීවර කර්මාන්තයි.
(නාරා ප්‍රකාශනයේ පල කිරීම සඳහා පත්‍රිකාව ඉදිරිපත් කොට ඇත.)

1.5.12 මල්දෙනිය, ආරම්.එම්.වොයිඩීන් එම් සහ ඩී.අමරසිරි ශ්‍රී ලංකාවේ කුඩා කෙලවල්ලන් වගී මසුන් සහ තෝර මසුන්ගේ ධීවර කර්මාන්තය පිළිබඳ වර්තමාන තොරතුරු ඉන්දියානු සාගරයේ කුඩා කෙලවල්ලන් තෝර මසුන් හා මසුන්පිළිබඳ පත්‍රිකාව ඉ.පැ.තා.වැ. වැඩ මුළුවේදී ඉදිරිපත්කොට ඇත. කොළඹ 1987 දෙසැ 9-10

1.5.13 කරුණාසිංහ ඩබ්.පී.එන්. ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරළ අද්දර ජලයෙන් සාඩිනෙල්ලා ස(රි)ම්(වැල්බයුම්) පිළිබඳ ධීවර කර්මාන්තය සහ දිග පදනට් කරගත් ජනගහන අධ්‍යන
(නාරා ප්‍රකාශනයේ පල කිරීම සඳහා පත්‍රිකාව ඉදිරිපත් කර ඇත.)

1.5.14 මෙම ඒකකයේ නිලධාරීන් විසින් පිළියෙල කොට ඇති වෙනත් වාර්තා:

(ඒ) "සමුද්‍ර මාරු" මුහුදු ගමනේවාර්තාව - 1987 ස.මා.-16

(බී) කෙලවල්ලන් සම්පත් පර්යේෂණය සහ සංවර්ධන අභ්‍යන්තර අත්පොත 87/2

(සී) හික්කඩුව සහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ හැඹිලිදැල් ධීවර කර්මාන්තය මෙහෙයවීම පිළිබඳ සමහර සලකා බැලීම්.

(ඩී) අක් වෙරළ සහ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්ත සංවර්ධනය

(ඊ) "කට්ටදෙල්" සහ විලාවේ "හරස්දෙල්" අතර සට්ටනයපිළිබඳ වාර්තාව.

(එෆ්) මීගමුවේ ඉස්සන් ධීවර කර්මාන්තයේ තොරතුරු පිළිබඳ වාර්තාව.

1.6 <u>උපකරණ</u>

"සමුද්‍ර මාරු" පර්යේෂණයාත්‍රාවේ ජීවවිද්‍යාත්මක කටයුතු කරගෙනයාමට පසුගිය වර්ෂයේදී මෙම ඒකකයවිසින් පහත සඳහන් උපකරණ ලබාගෙන තිබුණි.

| | | |
|---|---|---|
| 1. | ප්ලවාංග ඇල් | 2 |
| 2. | ප්‍රතිවර්තන උෂ්ණත්වමාන | 10 |
| 3. | සෙකිඩිකවච | 3 |
| 4. | නැන්සන් බෝතල | 6 |

1.7 <u>බාධක</u>

මෙම ඒකකයේ වැඩ කටයුතු දියත් කිරීමෙහිලා ඇති ප්‍රධාන බාධාව නම් දැනට පවතින ව්‍යාපෘතීන් පවා ක්‍රියාත්මක කිරීමට හිඟයක්ව පවතින පර්යේෂණ නිලධාරීන්ය. පසුගිය වර්ෂවලදී කෙලවල්ලන් ව්‍යාපෘතියේ පර්යේෂණ නිලධාරීන් තිදෙනෙකු නිරතවී සිටියහ. කණ්ඩායම් නායකයා පුනිවලදී සේවය අතහැර ගිය අතර, අනෙක් නිලධාරීන් පූර්ව උපාධි අධ්‍යනයන් සඳහා එක්සත් රාජධානය බලා පිටත්ව ගියේය. මෙම ව්‍යාපෘතියේ කටයුතු ව වර්තමානයේදී කාර්යභාර නිලධාරියා විසින් අධීක්ෂණය කරන අතර, මෙම කටයුතු මෙහෙයවීම ඉතිරිව ඇත්තේ එක් නිලධාරියකු පමණි. වෙනත් වැදගත් ව්‍යාපෘතීන් ක්‍රියාවට යෙදීමට ඇති නමුත් සේවකයන් හිඟවීමේ හේතුවෙන් මේතාක් දුරට එම අධ්‍යයනයන් ආරම්භකොට නොමැත.

මෙම ඒකකය සඳහා අවශ්‍ය මූලික උපකරණ එ.ජා.සැ.වැ. අරමුදල් යටතේ 1987 දී පිළියෙල කරන ලදී.

2.0 <u>ගොඩබිම් ජලජ සම්පත් ඒකකය</u>

2.1 1987 වර්ෂයේදී ගොඩබිම් ජලජ සම්පත් ඒකකයේ කාර්ය මණ්ඩලය ස්ථාවර පර්යේෂණ නිලධාරීන් 12, ස්ථාවර පර්යේෂණ සහායකයන් 5 සහ ස්ථාවර පර්යේෂණාගාර සේවකයන් දෙදෙනෙකුගෙන් සංයුක්ත විය. තාවකාලික පදනම මත සිටි වෙනත් පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙක් ද 1987 දී ඒකකයේ අමතරව විශේෂ ජ.ස.බැ./අ.ස.බැ. වැඩබිම් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා 1986 දී සේවයට බඳවා ගන්නා ලද පර්යේෂණ නිලධාරීන් ද 2, පර්යේෂණ සහායකයන් 2, සමාජ විද්‍යා සහයකයන් 1, ගෘහනිර්මාන ශිල්පීන් 1 සහ යතුරු ලේඛකයෙක් 1987 වර්ෂය මුළුල්ලේ ඒකකයේ වැඩ කලහ.

2.2 <u>කාර්ය වැඩ සටහන</u>

2.2 1987 වර්ෂයේදී පහත සඳහන් ව්‍යාපෘති නාරා අරමුදල් යොදාගනිමින් මෙහෙයවන ලදී.

2.2.1 <u>නාරා මඟින් අරමුදල් සපයන ව්‍යාපෘති:</u>

2.2.1 පිටිපන කිවුල් ජල මධ්‍යස්ථානයේ ඇති තටාකවල කිරි මත්ස්‍යන් (චානොස් චානොස්) ඇති කිරීම.

2.2.1.2 කලාඔය මොයේ සහ එරානතිව් දූපතේ කඩොලාන ප්‍රදේශවල කැඩුණු බිඳුණු අතුරිකිලි එකතුවීම

2.2.1.3 පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය සහ තබ්බෝව ජලාශවල ධීවර කර්මාන්තය මෙහෙයවීම.

2.2.1.4 ආටේමියා ව්‍යාපෘතිය.

2.2.1.5 මුහුදු පැලෑටි එකතු කිරීමේ නියැලී සිටින පිරිසුන්ගේ පිළිබඳ සමාජ ආර්ථික සමාලෝචනය

2.2.16 ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ ඇති මුහුදු පැලෑටි පිළිබඳ සමීක්ෂණය.

2.2.1.7 ශ්‍රී ලංකාවේ ඉස්සන් බෝකරන ස්ථානවල ඇති බාධකයන්ට අදාල ලෙඩරෝග පිළිබඳ අධ්‍යයන.

2.2.2. <u>විදේශීය/වෙනත් ග්‍රාමීය නියෝජිත ආයතන මඟින් අරමුදල් සපයන ව්‍යාපෘති</u>

2.2.2.1 ශ්‍රී ලංකාවේ වෙරළ අද්දර ප්‍රදේශවල ඉස්සන් බෝකිරීම සඳහා ජා.ස.බැ/ අ.ස.බැ. වැඩබිම් පරීක්ෂණය

2.2.2.2 නරේසා අරමුදල්ගත ව්‍යාපෘතීන්

2.2.1.1 පිටිපන තටාකවල කිරි මසුන් (චානොස් චානොස්) ඇති කිරීම.

1986 මැයි 20 -30 දක්වා පිටිපන කිවුල්ජල "ඉස්ටේසමේ" ඇති කිවුල්ජල තටාකවල කිරිමසුන් ගබඩා කරනලද අතර, 1987 ජනවාරියේ දී අස්වනු ලබාගන්නා ලදී. මෙම ප්‍රතිඵල මත පදනම්වූ පත්‍රිකාවක් පිළියෙල වෙමින් පවතී.

2.2.1.2 කලාඔය මෝය සහ එරියුමතිව් දූපතේ කඩොලාන ප්‍රදේශවල කැඩුණු බිඳුණු අතු රිකිලි එකතුවීම.

සත්ව වර්ගයන් සහ ශාක සංචරකයන් සඳහා කැඩුණු බිඳුණු අතුවල වියළි බර ප්‍රමාණයන් (වර්ග මීටර 1 ක තැටිවල හිරවී තිබුණු) ලබා ගැනීම මඟින් කලාඔය මෝයේ (ගඟා තීරය ආශ්‍රිත) කඩොලාන ප්‍රදේශවල සහ එරියුමතිව් දූපතේ ඉවුර ආශ්‍රිත කඩොලාන ප්‍රදේශවල කැඩුණු බිඳුණු අතු රිකිලි එකතුවීම අධීක්ෂණය කර තිබුණි. <u>රයිසොපෝරා මියුක්‍රොනාටා සහ ඇවිසෙනියා මැරිනා</u> සඳහා වැඩබිම් දෙකේ කඩොලානවල වටප්‍රමාණ වැඩිවීම හා උස්බිම් ජෛව ස්කන්ධ ඇස්තමේන්තු ක්‍රියාත්මක කරනලදී. ආර් මියුක්‍රොනේටා සහ ඒ මැරිනා (නරක්වීමේ ප්‍රමාණය) වලින් ශාක පත්‍රවල නරක්වීම අධීක්ෂණය කරන ලද්දේ කලාඔය සහ එරියුමතිව් දූපතේ කඩොලානවලිනි.

2.2.1.3 පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය සහ තබ්බෝව ජලාශ ධීවර කර්මාන්ත පාලනය.

පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය සහ තබ්බෝව ජලාශවලින් ඇල්ලීම/පරිශ්‍රමය සහ දිග ප්‍රමාණ වානිජ වශයෙන් වැදගත් මත්ස්‍ය වර්ගවල ප්‍රමාණය පිළිබඳ මාසික දත්ත රැස්කරගන්නා ලදී. පරාක්‍රම සමුද්‍රයේ සහ තබ්බෝවේ දත්ත රැස්කිරීම 1987 ජූලි මස දී අවසාන කෙරුණි. පසුගිය වර්ෂයේ අධ්‍යනයන්ගේ සොයාගැනීම්වලට අනුව, කවුඩුල්ල සහ මින්නේරියේ දත්ත රැස්කිරීම 1987 අගෝස්තු සිට නීව්‍ර කර ඇත.

අභිජනන ජීව විද්‍යාව වැනි ජීව විද්‍යාත්මක අධ්‍යයනයන් සඳහා වාණිජ වශයෙන් වැදගත් මත්ස්‍ය වර්ගවල ආදර්ශ සෑම මසකදීම ලබාගනී.

2.2.1.4 ආටීමියා පිළිබඳ පාරිසරික විද්‍යාත්මක අධ්‍යයනයන්

1987 වසරේදී පහත සඳහන් අංශයන් අධ්‍යනය කරන ලදී.

ඒ. මහලේවායේ තෝරාගත් ලුණු ලේවාවල ආටීමියාගේ ජනගහන සංයුතිය පිළිබඳ අධ්‍යනය.

බී මහලේවාය ලුණු ලේවායන්ගේ භෞත රසායනික ලක්ෂණයන් පිළිබඳ අධ්‍යනය

සී වෙළඳාම සඳහා කරදිය ඉස්සන් කෝෂයන් එකතුකිරීම සහ සකස් කිරීම

ඩී කරදිය ඉස්සන් කෝෂ පිළිබඳ ඇති කිරීමේ අධ්‍යනයන්.

2.2.1.5 මුහුදු පැලෑටි එකතු කිරීමේ නිරතවී සිටින පිනිසුන් පිළිබඳ සමාජ ආර්ථික සමාලෝචනය පුත්තලම් කලපුවේ ග්‍රැසිලේරියා කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයන්ගේ සමාජ ආර්ථික සමීක්ෂණය ක්‍රියාත්මක කරන ලදී. ප්‍රශ්ණ 35 කින් යුක්ත ප්‍රශ්ණ මාලාවක් සකස්කොට මෙම කර්මාන්තයේ යෙදී සිටින පිරිස අතර, සැලැස්මක් නොමැතිව බෙදාහරිනු ලැබීය. මෙම කාර්ය මත පත්‍රිකාවක් සකස් විය.

2.2.1.6 ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ ඇති මුහුදු පැලෑටි පිළිබඳ සමීක්ෂණය

ආදර්ශණය සහ තීර්ය රේඛා සමීක්ෂණයක් සඳහා මීගමුව, බේරුවල හික්කඩුව හා උණවටුන ගල්පරයට මාසික සංචාර මෙහෙයවන ලදී. ලබාගතහැකි සියළුම මත්ස්‍ය වර්ගයන්ගේ ප්‍රමාණාත්මක විශ්ලේෂණ එනම් තෙත් සහ වියළි බර වැනිදේ සැලකිල්ලට ගැණුනි.

2.3.1.7 ශ්‍රී ලංකාවේ ඉස්සන් බෝ කිරීමේ දී ඇති බාධකයන්ට අදාල ලෙඩ රෝග පිළිබඳ අධ්‍යන දිවයිනේ විවිධ ඉස්සන් බෝකරන ස්ථානවලින් තොරතුරු රැස්කරගනු ලැබිනි. බා බාධකයන්ට සම්බන්ධ ලෙඩරෝග අධ්‍යනය කෙරුනි. වාර්තාවක් සැකසෙමින් පවතී.

2.2.2.1 <u>ජා.ස.බැ/අ.ස.බැ. මඟින් අරමුදල් සපයන ව්‍යාපෘති</u>

ශ්‍රී ලංකාවේ වෙරළ තීරුවේ ඉස්සන් ගොවිපොලවල් පිහිටුවීමට බෝහෝ කර්මාන්තශාලා කුඩාපරිමාණ ව්‍යාපාරිකයන් සහ පුද්ගලයන් විසින් පෙන්වනලද ඇඩි උනන්දුව හේතුකොටගෙන අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික සංවර්ධන බැංකුව සහ ධීවර අමාත්‍යංශය හවුල්ව ඉස්සන් ඇති කිරීම ස්ථාපිත කිරීම සඳහා වැඩබිම් හඳුනාගැනීමට විද්‍යාත්මක අධ්‍යනයක් මෙහෙයවන ලෙස ජාතික ජලජ සම්පත් නියෝජිත ආයතනයට යෝජනාවක්

සමීක්ෂණය කල්පිටියේ සිට හම්බන්තොට දක්වා වන අතර, එය අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් මත අදියර 2 කට බෙදෙනු ඇත. ව්‍යාපෘතිය සඳහා ඇති මුළු අය– වැය වෙන්කිරීම රුපියල් දශලක්ෂ 2.8 වන අතර, එහි ප්‍රධාන සැපයුම්කරුවන් වන්නේ ජාතික සංවර්ධන බැංකුව සහ අපනයන සංවර්ධන බැංකුවයි. ව්‍යාපෘතියේ I අදියරට වන්නේ කල්පිටියේ සිට මීගමුව දක්වා ඇති ගොඩබිමේ වයඹදිග වෙරළේ ඉස්සන් ඇති කිරීම සඳහා යෝග්‍ය වැඩබිම් හඳුනාගැනීමයි. මොරටුව සිට හම්බන්තොට දක්වා ඇති ශ්‍රී ලංකාවේ නිරිත දිග වෙරළේ සුදුසු වැඩ බිම් හඳුනාගැනීම. II අදියරට වනු ඇත.

I. අදියර 1986 අගෝස්තුවේ දී ආරම්භ විය. පහත සඳහන් අංශයන් I අදියරට අයත්වන කලපු පද්ධතීන් හතරක එනම්, මීගමුව, ඕලාව, මුන්දල් සහ පුත්තලමේ 1987 අගෝස්තුවේදී අවසන්වන එක් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා අධ්‍යයනය කරන ලදී.

දේශගුණ විද්‍යාව:

1. දේශගුණික කලාප සහ මෝසම් සමයන්.
2. වර්ෂාව
3. වාතයේ උෂ්ණත්වය.
4. සුළඟේ ලක්ෂණ
5. වඩදිය බාදිය සහ ජල මට්ටම්

කෘෂිකාර්මික සංවර්ධනය පිණිස භූමිය යොදාගන්නා වර්තමාන ප්‍රදේශ:

1. භූමිය පාවිච්චි කරන වර්තමානආකාරය.
2. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ප්‍රදේශ
3. ජල සම්පත්.

පසේ භෞතික සහ රසායනික ලක්ෂණ:

1. පසේ පී.එච්.අගය
2. පසේ තාක්ෂණික විශ්ලේෂණ
3. පසේ ඓන්ද්‍රීය කාබන්.

ජලජ පරිසරවල භෞතික සහ රසායනික ලක්ෂණද

1. ජල උෂ්ණත්වය
2. ලුණුසාන්ද්‍රණය
3. පී.එච්.අගය
4. බොර සහිත බව
5. ද්‍රව්‍ය ඔක්සිජන්
6. පෝෂ්‍ය කොටස් (පොස්පේට්, නයිට්‍රයිට්, නයිට්‍රේට්ස්)

වඩදිය බාදිය හා ජල මට්ටම්
ස්වාභාවික ඉස්සන් බීජ සම්පත්

ප්‍රාථමික අභිජනනතා වය සහ ක්ලෝරපිල් සංයුතිය.
සත්ව ප්ලවාංග
නිතලවාසීන්
කඩොලාන වෘක්ෂලතා සහ සාමූහික සත්ව වර්ග
පරීක්ෂණ ප්‍රදේශවල ස්වභාවික සත්ව වර්ග
දූෂණය.

සහ සමාජ විද්‍යාත්මක ලක්ෂණ

දූෂණය හැදෑරීමපිණිස කලා ඔය, මීඔය, බත්තුළු ඔය, සෙනගල් ඔය, දෙදුරු ඔය, ඇදුගම් ඔය සහ ජා - ඇලෙන් ජල සාම්පල එකතු කරනලදී.

1987 සැප්තැම්බර් වන විට ව්‍යාපෘතියේ 1 අදියර සම්පූර්ණ කෙරුණි. ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ සිට මාස 3 කින් පසුව ලද මූලික වාර්තාව දැනටමත් ඉදිරිපත් කර ඇත. අවසාන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරතිබේ.

2.2.2.2 <u>නරේසා මඟින් අර මුදල් සහ ව්‍යාපෘති</u>

නරේසා ආයතනය පහත සඳහන් ව්‍යාපෘතීන් අරමුදල් ගත කර ඇත.

ඒ. හම්බන්තොට ආටිපියා සම්පත් පිලිබඳ අධ්‍යන 1987 දී දත්ත රැස්කරන ලදී. ව්‍යාපෘතිය ලබන වසරට කරගෙන යනු ඇත.

බී මීගමුව කලපුවේ කකුළු ධීවර කර්මාන්තය පිලිබඳ ආර්ථික විද්‍යාව - 1987 දී දත්ත රැස්කරන ලදී. ව්‍යාපෘතිය ලබන වසරට කරගෙන යනු ඇත යනු ඇත.

සී මීගමුව කලපුවේ වානිජ වශයෙන් වැදගත් කුඩා ඉස්සන් වැඩි කර මැනීමේ තාක්ෂණය

මීගුමු කලපුව ආවරණය කිරීමට ආදර්ශන වැඩ බිම් හතරක් ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳ සඳහා 1987 දී හදාරා සම්පූර්ණ කෙරුණි. අවසාන වාර්තාව නරේසා ආයතනයට ඉදිරිපත් කරන ලදී.

2.3 <u>කාර්ය මණ්ඩල පුහුණුවීම</u>

පහත සඳහන් නිලධාරීන් යටතින් සඳහන් කර ඇති කෙටි කාලීන පාඨමාලා මත පුහුණුවීම සම්පූර්ණ කර ඇත.

2.3.1 දොස්තර ඒ.ඩී.අල්විස්
මෝය පර්යේෂණ පිලිබඳ ප්‍රාදේශීය ආරම්භක පුහුණු පාඨමාලාව.
1987 සැප්තැම්බර් 14 - 28 කල්කටාව, ඉන්දියාව

2.3.2 යූ.එස්.අමරසිංහ මහතා
ධීවර දත්ත විශ්ලේෂණය සඳහා අධි සූක්ෂම පරිගණක භාවිතය පිලිබඳ දෙවැනි ප්‍රාදේශීය පාඨමාලාව (බෙ.බො.වැ. මඟින් ඉදිරිපත් කරන ලදී.) 1987 පෙබරවාරි 9 - 21 කොළඹ.

2.3.3 එම්.එම්.තුරුප්පු මහත්මිය.

කරදිය කුණිස්සා (ආටීමියා) පිළිබඳ 5 වැනි අන්තර් ජාතික පුහුණු පාඨමාලාව. බෙල්ජියම ගේන්ට් විශ්ව විද්‍යාලය, සති 6 ක්.

2.3.4 ඒ.එම්.එන්.පුෂ්පානන්දන මහතා (පරි.නි.)

ඉස්සන් ඇති කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාවක් සඳහා දස මසක කාලයකට යවන ලදී. ජපානය

2.4 <u>ග්‍රාමීය/විදේශීය සංස්කාරක සම්මේලන, වැඩ මුළුවලදී කාර්ය මණ්ඩලියේ සහභාගීත්වය</u>

2.4.1 යූ.එස්.අමරසිංහ මහතා ජලාශ ධීවර පාලනය සහ සංවර්ධනය පිළිබඳ ආසියානු කලාපයේ නේපාලය, කත්මන්ඩු පැවති වැඩ මුළුවට සහභාගිවී පත්‍රිකාවක් ඉදිරිපත් කලේය.

2.5 <u>ප්‍රකාශනයන්, පත්‍රිකා කියවීම, වෙනත් වාර්තා හා සේවයන්</u>

2.5.1 අමරසිංහ යූ.එස්. (!987) ශ්‍රී ලංකාවේ ඇති මිනිසුන් විසින් සාදනලද විලක්වන පිඹුරත්තැව වැවේ ධීවර කර්මාන්තය පිළිබඳ තතා රතුරු ජලජීවී වගාව, මත්ස්‍ය පාලනය 18100-00.

2.5.2 අමරසිංහ යූ.එස්. (මුද්‍රණයේ) මිනිසා විසින් තනනලදශ්‍රී ලංකාවේ ඇති විලක <u>ඔරියොකෝමිස් මොසැම්බිකුස්</u> (පීට (ර්) ස්) ගේ කරමල්දැල් ධීවර කර්මාන්.. සඳහා යෝග්‍ය ඇයි ප්‍රමාණය පිළිබඳ ප්‍රත්‍යක්ෂ මූලික නිගමනයආසියානු ධීවර කර්මාන්ත විද්‍යාව.

2.5.3 අමරසිංහ යූ.එස්, (මුද්‍රණයේ) වර්ධනය අධි උපයෝජනය: ශ්‍රී ල.කාවේ ජලාශ ධීවර කර්මාන්තයේ සිදුවියහැකි අනතුරකි. ආසියානු කලාපයේ ජලාශ ධීවර ගලනය හා සංවර්ධනය පිළිබඳ වැඩ මුළුව. 1987 නොවැම්බර් 22 - 29 නේපාලය කත්මන්ඩු (එස්.එස්.ද සිල්වා.: කතෘ) ජ.ස.ප.ම.කැනඩාව

2.5.4 අමරසිංහ යූ.එස්. (මුද්‍රණයේ) ශ්‍රී ලංකාවේ ජලාශවල පාලන උපායන් පරිපූරක කිරීමේ දී මසුන් මරන්නන්ගේ ක්‍රියා කලාපය ආසියානු කලාපයේ ජලාශ ධීවර කර්මාන්ත පාලනය සහ සංවර්ධනය පිළිබඳ වැඩ මුළුව. 1987 නොවැම්බර් 22 - 29 කත්මන්ඩු, නේපාලය (එස්.එස්.ද සිල්වා - කතෘ) ජා.ස.ප.ම.ප්‍රකාශනය ඔටාවා කැනඩාව.

2.5.5 අමරසිංහ යූ.එස්. සහ ජේ.අයි.සමරකෝන් මිනිසා විසින් සාදන ලද ශ්‍රී ලංකාවේ ඇති විලක කරමල් දැල් යොදා අල්වන මසුන් අතරට සිස්ලිඩ් මත්ස්‍ය වර්ග එට්රොපල්ස් ස.(ර්)රාටෙන්සිස් සහ තිලාපියා රෙන්ඩාලි බෙදාහැරීමේදී බලපාන සාධක ආසියානු ධීවර කර්මාන්ත විද්‍යාවට ඉදිරිපත් කරනලදී.

2.5.6 අමරසිංහ යූ.එස්. සහ ටී.ඒ.රාජපක්ෂ මහතා විසින් සකසන ලද ශ්‍රී ලංකාවේ ඇති පිලක <u>ඔරුයොකෝමිස් මොසැම්බිකුස්</u> ධීවර කර්මාන්තයේ තිබිය හැකි ප්‍රතිපූරක ක්‍රමය නාරා ප්‍රකාශයට ඉදිරිපත් කර ඇත.

2.5.7 රාජපක්ෂ ටී.ඒ.සහ යූ.එස්.අමරසිංහ ශ්‍රී ලංකා පුත්තලම් කලපුවේ <u>පීනායුස් සෙමිසල් කැටුස් ගේ එපිපෙනායියන් ඉන්ට්නස් නොබිලි</u> යන ජලක්ලෝම පරපෝෂිතය යෝඇතිවීම. ශ්‍රී ලංකා ජා.වි.ස.ස. ට ඉදිරිපත් කරන ලදී

2.5.8 අමරසිංහ,එම්.සී. ශ්‍රී ලංකා වේ කඩොලාන ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ තෝරාගත් කඩොලාන ප්‍රදේශවල වසන මනුෂ්‍ය කොට්ඨාශයන්ගේ සමාජ – ආර්ථික තොරතුරු(මුද්‍රණයේ) කඩොලාන පරිසරක්‍රමවල පර්යේෂණය සහ පුහුණුවීම පිලිබඳ එ.ජා.ස.වැ/යුනෙස්කෝ ප්‍රාදේශීය ව්‍යාපෘතිය.

2.5.10 ජයසූරිය ඒ.(1987)

චිලාව කලපුව අවට වර්තමාන කඩොලාන වෘක්ෂලතා සහ එම වගී සංයුතිය ශ්‍රී. වි.ස.(43)

2.5.11 ජයසූරිය ඒ.(1987)

පුත්තලම කලපුවේ ස්වාභාවිකව වැඩි <u>ගැඩිලේරියා ලයිකනොයිඩීස්</u> (මුහුදු පැලෑටි) නෙලීමේ සම්ප්‍රදායික වශයෙන්නියුතු වී සිටින මිනිසුන්ගේ සමාජ ආර්ථික අංශයන් ශ්‍රී.වි.ස.(43)

2.5.12 ජයසිංහ ජේ.එම්.පී.කේ.(1987)

ශ්‍රී ලංකා බටහිර වෙළේ හැජිය පාවිච්චිකරන වර්තමාන ආකාරය සහ ජලජීවී සංවර්ධනය ශ්‍රී.වි.ස.(43)

2.5.13 ජයසිංහ ජේ.එම්.පී.කේ.(1987)

ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ තිලාපියා ඇති කිරීමේ සමාජ ශක්‍යතාවය.

තිලාපියන් ඇති කිරීමේ 2 වැනිඅන්තර්ජාතික සඳහා පිළිගන්නා ලදී.

2.5.14 ජේ.ඩී.සිල්වා සහ පින්ටෝ එම්.එල්(1987)

මෝය නිතලවාසී සත්වවගී පිලිබඳ ප්‍රාථමික සමීක්ෂණය

ශ්‍රී.විස.(43)

2.5.15 ජයමාවත,එස්.සී. සහ ද අල්විස් ඒ ශ්‍රී ලංකාවේ පිහිනන ජලක්ලෝම කතුළුවන්ගේ තො රතුරු.

ශ්‍රී ලංකාවේ සත්ව වර්ගීකරණයේ වර්තමාන තොරතුරුපිලිබඳව පැවති සංස්කාරක සම්මේලනයේ ක්‍රියාදාමයන් එස්(ඒඑස්)ශ්‍රී.වි.ස. ඩී. අංශය 1987 ජූනි 20

2.5.16 <u>පර්යේෂණ වාර්තා</u>

ඒ. ජයසිංහ ජේ.එම්.පී.කේ.(1977)

මීගමුව කලපුවේ ආර්ථික වශයෙන් වැදගත් කුඩා ඉස්සන් ප්‍රතිපූරක කිරීමේ ...ක්ෂණය පිලිබඳ අධ්‍යන

නාජීසං ආයතනයේ පර්යේෂණ ප්‍රදාන (84/බී/9) සම්පූර්ණවීමෙන් පසු වාර්තාව පිටු 33කි.

බී. ශ්‍රී ලංකාවේ වෙරළබඩ තීරුවේ ඉස්සන් ඇති කිරීම සඳහා යෝග්‍ය ප්‍රදේශ හඳුනාගැනීමට සමීක්ෂණයේ ඇති ප්‍රාථමික වාර්තාව පිටු 65 කි.

සී. ශ්‍රී ලංකාවේ වෙරළබඩ තීරුවේ ඉස්සන් ඇති කිරීම සඳහා යෝග්‍ය ප්‍රදේශ හඳුනාගැනීමට සමීක්ෂණයේ ඇති මණ්ඩල වාර්තාව පිටු 308 කි.

## 2.5.17 උපදේශක සේවාවන්

ඒ. 1987 දී උපදේශක සේවා කිසි අටක් ක්‍රියාත්මක කරනු ලැබීය. ජලජීවී වගාව සඳහා වැඩබිම් තක්සේරු කිරීම, පාංශු විශ්ලේෂණය, ජල තත්ත්වය, සාම්පල ආදිය සේවාවන්ට අයත්විය. මෙය ජාතික සංවර්ධන බැංකුව/ අපනයන සංවර්ධන බැංකුව සඳහා භාරගත් උපදේශක සේවාවන්ට අමතරවිය.

බී. වයාපෘති යෝජනාවන්ගේ ඇගයීම

ජල ජීවී වගාව දියුණු කිරීමට නොයෙක් සංවර්ධකයන් විසින් ඉදිරිපත් කරනලද ව්‍යාපෘති යෝජනා 35 ක් පමණ අගයන ලදී.

## 2.6 උපකරණ

1987 දී ඒකකය විසින් පහත සඳහන් උපකරණ ලබාගනු ලැබුනි.

1. පරිගණක (පෞද්ගලික) (ජා.ස.බැ/අ.ස.බැ. අරමුදල් වලින්)
2. පී.එච්. අගය මනින මීටරය } (එ.ජා.ස.වැ. ව්‍යාපෘතියෙන්)
3. පාංශු ආදර්ශණ උපකරණ }
4.

## 2.7 බාධක

පහතින් දැක්වෙන්නේ ඒකකය විසින් 1987 වර්ෂයේදී මුහුණ දී ඇති බාධකය.

1. සේවය සඳහා ප්‍රමාණවත් අවකාශයක් නොතිබීම (පර්යේෂණ නිලධාරීන් සහ පර්යේෂණ සහයකයන්විශාල සංඛ්‍යාවක්)

2. රසායනාගාර පහසුකම් ප්‍රමාණවත්ව නොතිබීම/පහසුකම්

3. ජලජීවී වගා පර්යේෂණ සඳහා තටාක පහසුකම් හිඟවීම.

4 රට්වාගත ලබාගැනීමේ දුෂ්කරතාවය

5 නිසි පුහුණු වැඩ සටහන් ප්‍රමාණවත් නොවීම

## 3.0 අපර නිෂ්පාදන තාක්ෂණ විද්‍යා ආයතනය

### 3.1 සේවකයන්

1987 දී අපර නිෂ්පාදන තාක්ෂණික විද්‍යා ආයතනය (ත.අ.කා.ආ.) එහි අධ්‍යක්ෂකගේ මෙහෙයවීම යටතේ පර්යේෂණ නිලධාරීන් 9 දෙනෙකුගෙන් (8 ස්ථාවර හා එක් අයකු තාවකාලික පදනම මත) සමන්විත කාර්ය මණ්ඩලයක් සමඟ කටයුතු කලේය. පර්යේෂණ සහයකයන් 4 (සියළුදෙනාම ස්ථාවර) රසායනාගාර සේකයන් 4 (සියළුදෙනාම ස්ථාවර) සහ කම්කරුවන් 8 (එක් අයෙක් තාවකාලික පදනම මත) විසින් පර්යේෂණ කාර්ය මණ්ඩලයට සහය ලබාදෙනලදී. පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙක්අධ්‍යයන නිවාඩු මත විදේශගත වූහ. අනෙක් නිලධාරියා ගෙවීම් නොමැති නිවාඩු මත විදේශීය උසස් අධ්‍යන ලබා ගැනීම සඳහා සේවය අතහැර ගියේය.

### 3.2 කාර්ය වැඩසටහන

මෙම ඒකකය විසින් පහත දැක්වෙන වැඩ කටයුතු ඉටු කරන ලදී.

3.2.1 භාරය මගින්අරමුදල් සපයන ව්‍යාපෘති

3.2.1.1 සම්ප්‍රදායික ධීවර නිෂ්පාදනවල තත්ත්වය දියුණු කිරීම.

3.2.1.2 ගොඩබෑමේ දී තෙත මසුන්ගේ තත්ත්වය.

3.2.1.4 ඇති කරනලද ඉස්සන්ගේ ශාකාණු හඳුනා ගැනීම.

3.2.1.5 මිරිදිය මසුන්ගේ තත්වය කෙරෙහි ප්‍රමාද වී අයිස් දැමීමේ බලපෑම

3.2.1.6 පෝමලින් අධ්‍ය.

3.2.17 ශ්‍රී ලංකාවේ අයිස් නිෂ්පාදනය සහ වෙළඳපොල සැකැස්ම.

3.2.1.8 ව්‍යාප්ත ක්‍රියාකාරකම් සහ පරීක්ෂණසේවා

3.2.2 විදේශීය/වෙනත් දේශීය නියෝජිත ආයතන මගින් අරමුදල් සපයන ව්‍යාපෘති

3.2.1 භාරය මගින් අරමුදල් සපයන ව්‍යාපෘති

#### 3.2.1.1 සම්ප්‍රදායික ධීවර නිෂ්පාදනවල තත්ත්වය දියුණු කිරීම

එම ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වයන් ප්‍රධාන වශයෙන් උම්බලකඩ සහ ජාඩි සඳහා සීමාවිය. දේශීය වශයෙන් නිෂ්පාදනය කරන උම්බලකඩවල පහත් තත්ත්ව සඳහා හේතු හෙළිකරගැනීමට අධ්‍යන ක්‍රියාත්මක වූ අතර, අමාත්‍යංශයට වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

විවිධ ක්‍රම මගින් පිළියෙල කරගත් උම්බලකඩ ගබඩා කිරීමේ ලක්ෂණ පිළිබඳව සහ කෘමි උපද්‍රව වර්ගය අධ්‍යනය කිරීමට විද්‍යාත්මක වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

වෙනත් අධ්‍යනයකදී වෙනත් පුස් වර්‍ග දෙකක් සමඟින් ප්‍රතිශක්තිකරණය කල උම්බලකඩවල තත්ත්වය .ඉන්ද්‍රිය විභාග ක්‍රමයට විවිධ වර්‍ග මඟින් වෙන්කරගත් රසකාරක ලබාදෙන ගුණාංග සඳහා ය.

3.2.1.2 <u>ගොඩබෑමේ දී තෙත මසුන්ගේ තත්ත්වය</u>

නොවැම්බරයේදී එක් පරීක්ෂණයක් සම්පූර්ණ කරන ලද අතර, විශ්ලේෂණ 150 ක ප්‍රතිඵල සාකච්ඡා කරමින් පත්‍රිකාවක් පිලියෙල කරනු ලැබුනි.

3.2.1.3 <u>මසුන් ශීතකර ගබඩා කිරීමේ ලක්ෂණ</u>

පෙබරවාරියේදී ආරම්භකල අධ්‍යනය තවමත් කරගෙනයන අතර, ඉලක්ක කරගත් මත්ස්‍ය වර්‍ග 5 න් 2 ක් මෙතෙක්දුරට හදාරා ඇත. අයඩින් අගය පෙරොක්සයිඩ් අගය, ප්‍රෝටීන්, මේදය, තෙතමනය සහ පෝමලින් අධ්‍යනය කරන ලද පාරාමිතයන්ට අයත්වේ.

3.2.1.4 <u>ඇතිකරනලද ඉස්සන්ගේ ක්ෂුද්‍ර ශාකාණු හඳුනා ගැනීම</u>

ඇතිකරන ලද ඉස්සන්ගේ ක්ෂුද්‍ර ශාකාණු සැලැස්ම පිලිබඳ වැඩ කටයුතු 1987 දී සම්පූර්ණ කරනු ලැබීය.

ප්‍රකාශනය සඳහා ප්‍රතිඵල ලේඛණගත වෙමින් පවතී. ගොඩබෑමේදී මසුන්ගේ තත්ත්වය පිලිබඳ අධ්‍යනය අම්බලන්ගොඩ සිට කිරින්ද දක්වා ඇති දකුණු දිග වෙරළ කරගෙන ගිය අතර, අවසාන වාර්තාව සැකසෙමින් පවතී.

3.2.1.5 <u>මිරිදිය මසුන්ගේ තත්ත්වය කෙරෙහි ප්‍රමාද වී අයිස්දැමීමේ බලපෑම</u>

කලින්අධ්‍යනයක් මගින් මෙම අංශය මුහුදු මසුන් විශේෂ තුනක් සඳහා පරීක්ෂා කලේය. මිරිදිය ජලයේ සිටින වර්‍ග 3 ක් මෙහිදී හදාරනු ලැබුනි.

3.2.1.6 <u>පෝමලින් අධ්‍යනය</u>

නාරා කාර්‍ය මණ්ඩලය විසින් රැස්කරන ලද හා පිටස්තර සංවිධාන විසින් ඉදිරිපත් කළ දෙපාර්තමේන්තුම ආසන්න වශයෙන් මත්ස්‍ය සාම්පල 80 ක් සමාලෝචනය යටතේ ඇති කාල පරිච්ඡේදයේදී පරීක්ෂා කරනු ලැබුනි. පෝමලින් යෙදූ මසුන් හඳුනාගැනීමේ විධි පැහැදිලි කිරීම පිණිස ගුණසිංහපුර "ප්‍රදීපා ශාලාවේදී" සංස්කාරක සම්මේලනයක් පැවැත්වූ අතර, ගරුධිවර ඇමතිතුමා එහිදී මුලසුන ගත්තේය. විෂය සමග මාධ්‍ය වාර්තා කීපයක්ද පිලියෙල කළ අතර, පෝමලින් සඳහා මසුන් එම ස්ථානයේදීම පරීක්ෂා කිරීමේ ක්‍රමයක් ආයතනය විසින් දැන් දියුණු කරගෙන යමින් පවතී.

### 3.2.1.7 ශ්‍රී ලංකාවේ අයිස් නිෂ්පාදනය සහ වෙළඳපොල සැකැස්ම

1987 මැයි මස දී ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක විය. ඉහතින් දැක්වෙන දෙයට අදාල ක්ෂේත්‍රීය ක්‍රියාකාරකම් දිවයිනේ නිරිත දිග සහ දකුණු දිග වෙරළවල කරගෙන යනලදී. මෙම ප්‍රදේශවල ආයතන වශයෙන් අයිස් සාදන ස්ථාන 12 ක් පරීක්ෂා කර දත්ත රැස්කර ගති. ගොඩබිම් ප්‍රදේශවල පිහිටා ඇති ස්ථාන පසුව සංචාරය කරනුලබන අතර, අයිස් වෙළදාම් කිරීම සහ බෙදාහැරීමේ ආකාරය පිළිබඳ මූලික දත්ත රැස්කිරීමත් සමඟ මසුන් ගොඩබාන වැඩබිම්වලදී අවසාන ස්ථානයේ සමීක්ෂණ කරනු ලැබේ. සමීක්ෂණ ප්‍රදේශවල පවතින තත්ත්වය සැලකොටගෙන ව්‍යාපෘති කටයුතු 1987 සැප්තැම්බර් යේදී තාවකාලිකව කල්දමන ලදී.

### 3.2.1.8 ව්‍යාප්ත ක්‍රියාකාරකම් සහ පරීක්ෂණ සේවා

සමාලෝචනයට යටත්වන කාල පරිච්ඡේදයේදී ආයතනයේ නිලධාරීහු ප්‍රදර්ශනවලට අදාල (ගම් උදාව - කෘෂි වෙළඳපොල) ක්‍රියාවල යෙදුණහ. පොලිතින් දැමූ මාළු පිළිබඳ ක්ෂේත්‍ර ප්‍රදර්ශන සම්මේලන ද ඉදිරිපත් කරන ලද මාළු හා ජල ආදර්ශක 80 ක් පමණ පිළිබඳවයි සහ රසායනාගාර විශ්ලේෂණ පිළිබඳ සංස්කාරක සම්මේලන ක්‍රියාත්මකවූ අතර, පත්‍රිකාව ඉදිරිපත්විය. ආයතන විසින් දියුණු කල මසුන් වර්ග හතක් පදනම් කරගත් නිෂ්පාදන ප්‍රසිද්ධියට පත්කරන ලද අතර ක්‍රියාවලි පිළිබඳ නොයෙකුත් තොරතුරු නොයෙකුත් තොරතුරු පත්‍රිකා ඇතුළත්වූ 50කට නිකුත් කරන ලදී. ආයතන නිලධාරීන් නොයෙකුත් තාක්ෂණික කමිටුවලට සහභාගිවූ අතර, ධීවර පුහුණුපාසල් විශ්ව විද්‍යාල, දිස්ත්‍රික්ක ධීවර නිලධාරීන් විසින් පවත්වනලද සංස්කාරක සම්මේලන සහ ධීවර සමුපකාර ආදියේදී දේශණ පැවැත්වූහ.

### 3.2.2 විදේශීය/වෙනත් දේශීය නියෝජිත ආයතන මඟින් අරමුදල් සපයන ව්‍යාපෘති

### 3.2.2.1 මසුන් වෙළදාම් කිරීමේ අධ්‍යයනය

1986 අගෝස්තුවේදී ආරම්භ කල සමීක්ෂණය 1987 නොවැම්බරයේදී සම්පූර්ණ කරන ලදී. පාරිභෝජකයින්, මසුන් සකසන්නන් සහ මාළු වෙළෙන්දන් ලවා සම්පූර්ණකර ලබාගත් ප්‍රශ්නමාලා 1400 පමණ විශ්ලේෂණය පිණිස කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක මධ්‍යස්ථානයට භාරදී ඇති අතර, අවසාන වාර්තාව සම්පාදනය වෙමින්පවතී. සමීක්ෂණය ක්‍රියාත්මක කරන ලද්දේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයත් සමඟ සහයෝගයෙනි. සමීක්ෂණයේ තොරතුරු අනුව භාරගතයුතු පර්යේෂණ කටයුතු අයත් ව්‍යාපෘති වාර්තාවක් දැන් සමුපූ සම්පූර්ණවෙමින් පවතී.

### 3.3 කාර්ය මණ්ඩල පුහුණුවීම

සී. වීරසූරිය මහත්මිය නවසීලන්තයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණියාය.

3.4 දේශීය/විදේශීය සංස්කාරක සම්මේලන, වැඩ මුළුවලදී
කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය
කිසිවක් නොමැත

3.5 ප්‍රකාශන, පත්‍රිකා කියවීම, වෙනත් වාර්තා හා සේවා

3.5.1 අසුරු සැමන්වල (ඇම්බ්ලිගැස්ට (රි)ස (රිම් ) පරිහරණය කිරීම, ඝනීභූත ගිරීම
හා රසීන ඇසිරීමට අදාල අනුජීව විද්‍යාව උපාධි ප්‍රබන්ධය. එම්.විකිවාසගම්

3.5.2 ශ්‍රී ලංකාවේ අකුණුදිග වෙරළේ ගොඩබෑමේදී මසුන්ගේ තත්ත්වය. කොරියාවේ පැවත්වූ
එ.ජා.සං.ජයවීර (ශ්‍රී.වි.ස.පත්‍රිකාව)

3.5.3 කොරියාවේ පැවැත්වූ වැඩ මුළුවට ශ්‍රී ලංකාවේ
පැසවීමෙන් සකස්කරගත් ධීවර නිෂ්පාදන ඉදිරිපත් කරන ලදී. එස්.සුබසිංහ

3.5.4 ශ්‍රී ලංකාවේ සමුද්‍රීය පරිසරයේ තත්ත්වය ප්‍රකාශනය එ.ජ.ස.වැ.ට
ඉදිරිපත් කෙරුණි - එස්.සුබසිංහ

3.5.5 වෙනත්ක්‍රම තුනක් මගින් ඔරියොක්‍රොමිස් නිලොටිකුස් ගේ අන්තර් විශ්ලේෂණ
සහ මාංශ ලබාගැනීමේ ප්‍රතිශතය විද්‍යාඥ උපාධි ප්‍රබන්ධ තේමාව ඒ.කුරෙයිරත්නම්

3.5.6 ගැප්පිරියම් ටයුපීඩම් (වැසිලියා) සහ මාසියා ඔපිමා (මට්ටියා) ගේ වියළි
මාංශවල මාංශ ලබා ගැනීමේ ප්‍රමාණය සහ ගබඩා කිරීමේ ලක්ෂණ පිළිබඳ
අධ්‍යනය විද්‍යාඥ උපාධි ප්‍රබන්ධය තේමාව එන්.ඩී.රූබසිංහ

3.5.7 අසුරු සැමන් (ඇම්බ්ලිගැස්ට ස(රි)ම්) ගේ කල්තබාගැනීමේ තත්ත්වයට බලපාන
ඔක්සිටෙට්‍රාසයික්ලින් තේමාව එස්.එම්.සරනායක

3.5.8 කල්තබාගැනීමේ තත්ත්වයට බලපාන උම්බලකඩවල ලුණු සහ තෙතමන සංයුතිය
විද්‍යාඥ උපාධි ප්‍රබන්ධය තේමාව එම්.ඩී.වනිගසේකර

2.6.9 ශ්‍රී ලංකාවේ පිරිදිය මසුන් නිෂ්පාදන ක්‍රියාවලියේ දී පිළියෙල කිරීමේ දී
සිදුවන තත්ත්ව හානිය හා අපතේයාම . එස්.සුබසිංහ, ගොඩකන්ද, ජේ.සී.
පළමුවන ආසියානු ධීවර මණ්ඩලය පිටු 459 -642

3.6 <u>උපකරණ</u>
කිසිවක් නොමැත.

3.7 <u>බාධක</u>
උපකරණ හිඟ බව.

4.0 ඉංජිනේරු සහ තාක්ෂණික අංශය

4.1 සේවකයන්

1987 ආරම්භයේදී මෙම ඒකකයට ස්ථිර පර්යේෂණ නිලධාරීන් 2, ස්ථිර පර්යේෂණ සහායකයන් 2 සහ එක් ස්ථිර රසායනාගාර සේවකයෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් තිබුණි. වර්ෂයේ දෙවන කාර්තුවේදී එක් පර්යේෂණ නිලධාරියකු සේවා සහ මෙහෙයුම් ඒකකයට මාරු කරනලදී. ඒකකයේ කාර්ය භාර නිලධාරියා 1987 ඔක්තොම්බරයේදී එක්සත් රාජධානිය බලා පිටත්විය. එතැන් සිට සේවා සහ මෙහෙයුම් ඒකකයට මාරු කරනලද පර්යේෂණ නිලධාරියා පර්යේෂණ වැඩ කටයුතු සම්බන්ධීකරණය .

4.2 කාර්ය වැඩ සටහන

පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අංශය විසින් 1987 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබීය.

4.2.1 භාරා මගින් අරමුදල් සපයන ව්‍යාපෘති

4.2.1.1. කැළණි ගඟා මෝය ප්‍රදේශයේ මසුන් අල්ලා ගැනීමේ අත්හදා බැලීම්

4.2.1.2 විදේශීය/වෙනත්දේශීය නියෝජිත ආයතන මගින් අරමුදල් සපයන ව්‍යාපෘති

4.2.2.1 කෙලවල්ලන් සම්පත් පරීක්ෂණ

( - 6653)

4.2.2.2 ධීවර ආම්පන්න සහ යාත්‍රා වට්ටෝරුගත කිරීම

4.2.1 භාරා මගින් අරමුදල් සපයන ව්‍යාපෘති

4.2.1.4 කැළණි ගඟා මෝය ප්‍රදේශයේ මසුන් අල්ලා ගැනීමේ අත්හදා බැලීම්.

1987 දෙවන කාර්තුවේදී මෙම කාර්ය ක්‍රියාත්මක විය. කැළණිගඟා මෝය ප්‍රදේශය දිගේ ඇති ස්ථාන 8 කදී විවිධ ඇහි ප්‍රමාණයන් යොදාගනිමින් මසුන් අල්ලා ගැනීමේ අත්හදා බැලීම් ක්‍රියාත්මක කරන ලදී. මෙම ස්ථාන පරිසර අධීක්ෂණ ඒකකය මගින් තෝරාගත් ආදර්ශණ ස්ථාන සමග ගැලපෙන ලෙස කැළණි මෝයේ ජල දූෂණය හැදෑරීම සඳහා තෝරාගන්නා ලදී.

සෑම අත්හදා බැලීමකදීම, සමාන දැල් කට්ටල දෙකක් ක්‍රියාත්මක කරනුලැබුණි. එකක් දූෂිත ප්‍රදේශයක වන අතර, අනෙක එයින් දුරස්ථය. මෙම අත්හදා බැලීම් මගින් මත්ස්‍ය ජනවිශේෂ වලට දූෂකකාරකයන්ගෙන් වන බලපෑම පෙන්නුම් කරන අතර, මෙම මෝයේ මසුන් අල්ලා ගැනීමේ හැකියාව ද නිරීක්ෂණය කලහැකිවනු ඇතැයි අපේක්ෂා කරන ලදී

4.2.1.2 **වෙනත් සංවිධානාත්මක කාර්යයන්**

ඒ. මෙම ඒකකයේ සේවා නිලධාරීන් මෙවැනි වෙනත් සංවිධානාත්මක වැඩ කටයුතු සඳහා යොදවනු ලැබුහ.
ත්‍රිකුණාමලයේ සමුද්‍ර - කම්රපායි අධ්‍යන වැඩ කටයුතු
නාරා පර්යේෂණ යාත්‍රා පිළිසකර කරවීම
ත්‍රිකුණාමලය සහ කල්පිටියේ පිහිටි නාරා කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානයේ පිළිසකර කරවීම සහ සංවර්ධනය.

බී. ධීවර අමාත්‍යංශය විසින් ... ඇති පරිදි මෙම ඒකකයේ නිලධාරීන් ද 1987 දී ව්‍යාපෘති කීපයක තාක්ෂණික කමිටුන්ගේ සමාජිකයන් ලෙස රැස්වීම්වලට සහභාගිවෙමින් සේවය කළහ.

4.2.2 **විදේශීය/වෙනත් ... නියෝජිත ආයතන මගින් අරමුදල් සපයන ව්‍යාපෘති**

4.2.2.1 කෙලවල්ලන් සම්පත් සමීක්ෂණ ව්‍යාපෘතිය
6653

ඉහත ව්‍යාපෘතියේ යොදවා ඇති මසුන් අල්ලන යාත්‍රාවල ප්‍රායෝගික වැඩකටයුතු ඉංජිනේරු සහ තාක්ෂණික විද්‍යා ඒකකය විසින් මෙහෙයවන ලදී. එක් පර්යේෂණ සහයකයකු යාත්‍රා (ළදිඉ5යාත්‍රා35) පිළිසකර කරවීම් පරීක්ෂණ උපකරණ සවිකිරීම, ධීවර ආම්පන්න පිරිද්දීම සහ මසුන් ඇල්ලීමේ අත්හදාබැලීම්වලට අදාල ... කිරීමේ ... අධීක්ෂණය කිරීමට පූර්ණකාලීනව නියුක්තව සිටියේය.

අයෙකු නිලධාරීන් ද සමුද්‍ර ධීවර කර්මාන්ත ඒකකයෙන් විමසීමෙන්පසු මුහුදු ගමන් සැලසුම් කිරීමේ කටයුතුවල නියුක්තවූහ. මුහුදු ගමන් මාර්ග අධීක්ෂණ කිරීම, සහ යාත්‍රාවේ ආරක්ෂිත යාත්‍රා කිරීම සහතික කිරීමේ කටයුතු වල ද ඉංජිනේරු තාක්ෂණික විද්‍යා ඒකකය නියුතු විය.
මෙම ඒකකය විසින් යාත්‍රාවේ වර්ෂය මුළුල්ලේ කාර්යයන් සාර්ථක ලෙස මෙහෙයවූ අතර, මේ දිව දක්වා ගවේෂණාත්මක මසුන් ඇල්ලීමේ අත්හදා බැලීම් 37 ක් සම්පූර්ණකර ඇත. එම පර්යේෂණ සහකරුවකු ඒකකයේ ප්‍රධානියන්ගේ අධීක්ෂණය යටතේ ඉහත රාජකාරීන් ක්‍රියාත්මක කිරීමට පූර්ණ කාලීනව යොදවා ඇත. පර්යේෂණ සහකරුවන් සහ රසායනාගාර සහකරුවන් ද අවශ්‍යවූවිටක ඉහත වැඩකටයුතුවලට සහය වූ අතර, කලින් සැකසූ වැඩ වාර ලේඛණයක් අනුව නිරීක්ෂණයන් ලෙස සියවාරයන් ලබාගත්හ.

මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් අරමුදල් ඉතිරිවී ඇති බැවින් එය 1988 දී කරගෙනයනු ඇතැයි අපේක්ෂා කෙරේ.

4.2.2.1 **මසුන් මරන ආම්පන්න සහ යාත්‍රා වට්ටෝරුගත කිරීම**

මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණවන්නේ කර්මාන්තය ... විසින් මුහුණ දී ඇති තාක්ෂණික විද්‍යාත්මක ගැටළු හඳුනා ගැනීමයි. ශ්‍රී ලංකාවේ මසුන් අල්ලන ආම්පන්න යාත්‍රා සහ ක්‍රම පිළිබඳව නාමාවලිය/බඩු ලැයිස්තුවක් පිළියෙල කිරීම පර්යේෂකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ මෙම කර්මාන්තායතනයේ පාලකයින් ආදීන් වෙනුවෙන් ප්‍රයෝජනවත් වනු ඇත.

සීමාසහිත කාර්ය මණ්ඩලය හා කා.ස.වැ. සම්බන්ධයෙන් හා ව්‍යාපෘතියේ සම්බන්ධයෙන් වෙනත් ඒකක සහ සංවිධානාත්මක ක්‍රියාකාරකම් හේතුකොටගෙන මෙම විශේෂ ව්‍යාපෘතියේ ප්‍රමාණවත් වැඩකටයුතු 1987 දී ක්‍රියාත්මක කල නොහැකි විය. 1987 දී කල්පිටිය සිට කිරින්ද දක්වා ඇති සියළුම මසුන් අල්ලන මධ්‍යස්ථාන ආවරණය කිරීම අපගේ අභිප්‍රාය විය. කෙසේවෙද බේරුවල අවට මසුන් අල්ලන මධ්‍යස්ථාන කීපයක් හැර කොළඹ සිට ආනමඩුව තෙක් ඇති මසුන් අල්ලනමධ්‍යස්ථාන, මීගමුව සිට හලාවත දක්වා ඇති මසුන් අල්ලන මධ්‍යස්ථාන සහ කල්පිටියේ ස්ථාන කීපයක් සමීක්ෂණය කලහැකි විය.

4.3 කාර්ය මණ්ඩල පුහුණුවීම

4.3.1 කේ.ටී.වීරසූරිය මහතා පර්යේෂණ නිලධාරී 1987 ඔක්තොම්බරයේදී නාවික නිර්මාණ ශිල්පය පිළිබඳ විද්‍යාපති විද්‍යා පාඨමාලාවක් හැදෑරීමට එක්සත් රාජධානිය බලා පිටත්විය.

4.3.2 එන්.එස්.සී.පීරිස් මහතා ගවේෂණාත්මක මසුන් ඇල්ලීම පිළිබඳ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ ආධාර සහ සහය ලබාදෙනුවස් දෙසැම්බරයේදී මාලදිවයින් දූපත්වල සිටියේය.

4.4 දේශීය /විදේශීය සංස්කෘතික සම්මේලන වැඩ මුළු ආදියේදී කාර්ය මණ්ඩල සහභාගිත්වය.

කිසිවක් නොමැත.

4.5 ප්‍රකාශන, පත්‍රිකා කියවීම, වෙනත් චාරිකා සහ සේවා

කේ.ටී.වීරසූරිය මහතා, ශ්‍රී ලංකාවේ අඩු මිලක් වැයවන මසුන් රැස්කිරීමේ ක්‍රම. බෙ.බෝ.වැ. වාර්තා 1987 අගෝස්තු

4.6 උපකරණ

කිසිවක් නොමැත.

4.7 බාධක

ඉහත සඳහන් අංශයන් පිළිබඳ පර්යේෂණය ක්‍රියාත්මක කිරීමට මෙම ඒකකය සඳහා වෙන්කර ඇති අරමුදල් සහ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කරඇත.

5.0 සාගරවිද්‍යා අංශය

සාගර විද්‍යා අංශය 1987 දී පහත සඳහන් කාර්ය මණ්ඩලය සමග කටයුතු කලේය. පර්යේෂණ නිලධාරීන් 3, පර්යේෂණ නිලධාරීන් 1 (කොන්ත්‍රාත්), පර්යේෂණ සහායකයන් 2, රසායනාගාර සහයකයන් 1 (ස්ථිර) සහ එක් රසායනාගාර සහයකයෙක් (කොන්ත්‍රාත්)

5.2 <u>කාර්ය වැඩ සටහන</u>

සමාලෝචනයට යටත්වන කාල පරිච්ඡේදයේ දී පහත සඳහන් වැඩ කටයුතු භාරගන්නා ලදී.

5.2.1 නාරා මගින් අරමුදල් සපයන ව්‍යාපෘති

5.2.1.1. භූ විද්‍යාව සහ භෞතික විද්‍යාව.

5.2.1.2 ගොඩබිම් හිරිගල් සහ පිබිලිකඩු වලවල් පිළිබඳ අධ්‍යයනය

5.2.2.1 ප්‍රධාන ගඟාවල අවසාදිත සහ ඒවායේ ප්‍රභවයන්

5.2.2.2 කරගම්ලේවායේ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ අධ්‍යනය.

5.2.2.3 හිරිගල් සහ කවච පාත්ති ව්‍යාපෘතිය.

5.2.1.1 <u>භූ විද්‍යාව සහ භෞතික විද්‍යාව</u>

සමුද්‍ර විද්‍යා මුහුදු ගමන් වැඩසටහන 1987 දී වේගවත් ප්‍රගතියක් පෙන්වූ අතර, මුහුදු ගමන් 17 - 9 ක් සම්පූර්ණ කෙරුණි. කල්පිටිය සිට වැලිගම දක්වා ඇති මහාද්වීපික වැලිකණ්ඩි සහ බෑවුම් ප්‍රදේශවල 1:2000000 පරිමාණයක් මත සමීක්ෂණය කරන ලදී. "සමුද්‍ර මාරු" පර්යේෂණ යාත්‍රාව 1987 දී දින 52 ක් මුහුදේ තිබුණි. නොගැඹුරු කම්පන සහ පත්ලෙන් ලබාගත් ද්‍රව්‍ය දත්තයක ශ්‍රී ලංකාවේ බටහිර දිග මහාද්වීපය තීරුවේ භූ විද්‍යාව පිළිබඳ ඉතා අගනා නව දත්ත සපයා ඇත.

මෙම මුහුදු ගමන් පිළිබඳ ලබාගත් ප්‍රතිඵල "සමුද්‍ර මාරු" වාර්තාවන්ට සංයුක්ත කර ඇති අතර, සමුද්‍ර මාරු වාර්තා 2 - 13 ක් ප්‍රකාශනය කර ඇත. මුහුදු පත්ලේ රූපික විද්‍යාව දක්වන අගාධ මිතික සිතියම් අවසාදිත පැතිරීම දක්වන සිතියම් ... භූ උපද්‍රෝණිපලයේ ආකෘති දක්වන සිතියම් පිළියෙල කර ඇත. පත්ලේ රළු ස්වභාවයන් සහ වෙනත් නො රතුරු ඇතුලත් කරගනිමින් කල්පිටිය ප්‍රදේශය සඳහා පලමුවන ධීවර සටහන පිළියෙල කරන ලදී. මෙම සටහන නව කෙටි කලකින් ට්‍රෝලර් යාත්‍රා ගමන්කල හැකි ප්‍රදේශ, සහ මෙවැනි ප්‍රදේශවල යෙදියයුතු මසුන් මරන ආම්පන්න වර්ග දක්වමින් ප්‍රකාශණය වන අතර, එය මසුන් මරන්නන්ට බෙදා හරිනු ලැඇත.

ශ්‍රී ලංකාවේ නිරිත දිග වෙරලෙන් ඔබ්බෙන්පිහිටි අක්වෙරළ ඛනිජ පිළිබඳ ක්‍රියාත්මකවූ වැඩ කටයුතුවල ... එක්සත් ජාතීන්ගේ පරිභ්‍රමණ අරමුදල් මගින් අනුග්‍රහය කරනලදී. අක්වෙරළ විශාල ඛනිජ නිධිවල ශක්‍යතාවය තවදුරටත් අගය කිරීමේ සීමාසහිත සමීක්ෂණ වැඩ සටහනක් සඳහා කැබිනට් අනුමැතිය ලබාගනු පිණිස ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

5.2.1.2 <u>ගොඩබිම් කොරළ සහ කවච පතල් පිළිබඳ අධ්‍යනය</u>

අකුරල සිට හම්බන්තොට දක්වා ප්‍රදේශයේ ඇති ගොඩබිම්හිරිගල් සහ කවච පතල් පිළිබඳ අධ්‍යනය සම්පූර්ණ කර ඇති අතර, දැනට ක්‍රියාත්මක වන සියළුම කවච පතල් හා අතහැර දමා ඇති පතල් පිහිටීම දක්වන සිතියකටයි හම්බන්තොට, අම්බලංගොඩ දක්වා ඇති දිස්ත්‍රික්කය සඳහා පිළියෙළවිය.

...........................

5.2.2 <u>විදේශීය/වෙනත් [illegible] නියෝජිත ආයතන මගින් අරමුදල් සපයන ව්‍යාපෘති</u>

5.2.2.1 කළු ගඟා නිම්න ප්‍රදේශය ආවරණය කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගඟාවල අවසාදිත සහ ඒවායේ [illegible] පිළිබඳ වූ ව්‍යාපෘතිය පරමාණු ශක්ති අධිකාරියේ සහයෝගය ඇති සැප්තැම්බරයේදී සම්පූර්ණ කරනලදී. 1986 දී ආරම්භකර ඇති මෙම ව්‍යාපෘතිය ප්‍රධාන එක් ගඟාවක් වාර්ෂිකව පරීක්‍ෂා කිරීමට සැලසුම් කරන අතර, අතර, අරමුදල් හෝ විශ්ලේෂණාත්මක පහසුකම් හිඟවීම හේතුකොටගෙන අ[illegible] සාදිතයන්ගේ රසායනික [illegible] මත් නිර්ණය කලයුතුව [illegible] ඇල [illegible] වල අඛණ්ඩ ප්‍රගතියක් දක්නා ලැබේ.

5.2.2.2 නාරා [illegible] අධ්‍යයන [illegible] ජා.ස.ස. සහයෝගය ඇතිව කරගම්ලේවායේ පාරිසරික [illegible] ව් ඇස්තමේන්තු [illegible] සැප්තැම්බරයේදී භාරගන්නා ලද අතර, පත්‍රිකාවක් ද ඉදිරිපත් විය.

5.2.3.3. හිරි [illegible] සහ කවච පාත්ති පිළිබඳ ව්‍යාපෘතිය පූර්ව තෘතීය යුගයේ මුහුදු මට්ටම් උච්චාවචනය අනුබන්ධනය සහ මතු කාලයේ උපයෝගී කරගැනීමේ අන්තර්ජාතික හෑ විද්‍යාත්මක අනුබන්ධී වැඩ සටහන සමග එක්කරන ලද අතර, මෙම වැඩ සටහන සඳහා ශ්‍රී ලංකාවේ ජාතික නියෝජිතවරයා වූයේ එන්.පී.විජයානන්ද මහතාය.

5.3 <u>කාර්ය මණ්ඩල පුහුණුවීම</u>

5.3.1 වෛද්‍ය ශාන්ති වික්‍රමරත්න ප්‍රනියේදී නූතන තාක්ෂණය සඳහා [illegible] අන්තර් සී ක්ලාක් මධ්‍යස්ථානය විසින් පවත්වන ලද "දුරස්ථ සං වේදනයේ" පිළිබඳ සති එකක වැඩ වැඩ මුළුවකට සහභාගිවිය.

5.3.2 ආචාර්ය පී. රණතුංග මුහුදු තැනීම පිළිබඳ විශේෂ අවධාරණයක් ඇති සමුද්‍ර සම්පත්වල පාලනය සහ සමීක්ෂණ පිළිබඳ ජාත්‍යන්තර සමුද්‍ර ආයතනය විසින් ෆෙල්ට් හා බටහිර ජර්මනියේ පවත්වන ලද සති 10ක පුහුණු පාඨමාලාවකට සහභාගිවිය.

5.3.3 එන්.පී.විජයානන්ද මහතා මැඩගස්කරයට අ.සා.ස. මගින් පවත්වන ලද අංකාධපිතික සිතුවම්ගත කිරීමේ සති 3 පුහුණු පාඨමාලාවකට බටහිර ජර්මනියේ "මීටෙර්" නමැති යාත්‍රාවේදී සහභාගිවූයේය.

5.3.4 ආචාර්ය ශාන්ති වික්‍රමරත්න එක්සත් රාජධානියේ බ්‍රිස්ටොන් හි අ.සා.ස. මගින් පවත්වනලද "පහත් මුහුදු මට්ටම" පිළිබඳ සති 3 පුහුණු පාඨමාලාවකට සහභාගි විය.

5.3.5 එන්.පී.විජයානන්ද මහතා "ජොයිඩීස් රිසොලූෂන්" නැමැති යාත්‍රාවේ [illegible] වශයෙන් සාගරය පිදීමේ වැඩසටහනේ 116 වැනි ගමන සඳහා සති 6 ක මුහුදු ගමනකට සහභාගිවූයේය.

5.36 ආචාර්ය ශාන්ති වික්‍රමරත්න යුනෙස්කෝ සති 12 ක ශිෂ්‍යත්වයක් මත ස්ක්‍රිප්ස් සමුද්‍ර විද්‍යා ආයතනයේ සිටියාය.

5.3.7 එන්.පී. විජයානන්ද මහතා ඔහුගේ පී.එච්.ඩී. උපාධිය සඳහා හැදෑරීමට යුනෙස්කෝ ශිෂ්‍යත්වයක් මත ලන්ඩනයේ රාජකීය විද්‍යාලය බලා පිටත්විය.

5.3.8 ඩී. ජයවර්ධන මහතා නාරා විසින් පැවැත්වූ සුන්බුන්යාත්‍රා පිළිබඳ රැස්වීමකට සහභාගිවූයේය.

5.3.9 ඩී. ජයවර්ධන මහතා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ සාගර පුරා විද්‍යාව පිළිබඳ රැස්වීමකට සහභාගිවූයේය.

5.4 දේශීය/විදේශීය සංස්කාරක මණ්ඩල වැඩමුළුවලදී කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය

5.4.1 ආචාර්ය ශාන්ති වික්‍රමරත්න 1987 ජනවාරි 20-28 දක්වා පවත්වන ලද ?.සා.ස.ක සම්මේලනයට සහභාගිවිය.

5.4.2 රණතුංග සහ වික්‍රමරත්න යන ආචාර්යවරුන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේදී පවත්වනලද පූර්ව කේම්බ්‍රියානු යුගය පිළිබඳ අන්තර්ජාතික ජීව විද්‍යාත්මක අනුබන්ධ වැඩ සටහන (අ.ජ.අ.වැ.) රැස්වීමට සහභාගිවූහ.

5.4.3 ආචාර්ය වික්‍රමරත්න මෙම වුඩ්ස්හෝල් සමුද්‍ර විද්‍යා ආයතනය, එක්සත් ජනපද භූ ගර්භ විද්‍යා සමීක්ෂණය අත්ලන්තික් ශාඛාව සහ ලැමොන්ට් ඩොහර්ටි විද්‍යාත්මක නිරීක්ෂණාගාරය සංචාරය කළ අතර, මෙම ආයතන සමඟ සහයෝගිතා සාගර විද්‍යාත්මක පර්යේෂණක්‍රියාත්මක කිරීමේ හැකියා සාකච්ඡා කෙරුවේය.

5.5 ප්‍රකාශන, පත්‍රිකා කියවීම, වෙනත් වාර්තා සහ සේවා

5.5.1 සමුද්‍ර මාරු පුහුණු ගමන් වාර්තා - ස.මා.2,3,4,6,8,9,10.11

5.5.2 බොල්ගොඩ, කැළණිය සහ මහඔය මෝයන් සමීක්ෂණ පිළිබඳ වාර්තාව.

5.5.3 මහඔය සහ පානදුර මෝයවල රොන්මඩ පිරීමේ ප්‍රමාණ පිළිබඳ වාර්තාව.

5.5.4 හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි යෝජිත කරගම් ගල්වාය ලුණු ලේවායේ පරිසර බලපෑම් ඇස්තමේන්තු කිරීම පිළිබඳ වාර්තාව.

5.5.5 ධීවර අංශයේ සංවර්ධනය පිළිබඳ වාර්තාව.

5.5.6 ශ්‍රී ලංකාවේ සාගර පර්යේෂණ ... පිළිබඳ වාර්තාව නරේසා ආයතනයට ඉදිරිපත් කරන ලදී.)

5.5.7 ජපානය මගින් අරමුදල් සපයන මෙහෙයුම් පිළිබඳ වාර්තාව ධීවර අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

5.5.8 ශ්‍රී ලංකා සමුහාණ්ඩුවේ බර ඛනිජනිධි අක්වෙරළ සඳහා කෙටුම්පත් නිර්දේශ කිරීම්.

5.5.9 ඩබ්.එස්.වික්‍රමරත්න "සමුද්‍ර මාරු " පර්යේෂණ යාත්‍රාව ශ්‍රී ලංකාවේ බටහිර දිග මහාද්වීපික තීරුවේ සමීක්ෂණය කරයි. ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සමාජයප්‍රවෘත්ති ලිපිය කාණ්ඩය 4 නො.3

5.5.10 එන්.පී.විජයානන්ද ජොයිසිස් මුහුදු ගමන් යාත්‍රාව 116, නැව් ගමන දකුණු දිග ශ්‍රීලංකාවේ ශ්‍රී ලංකා භූ විද්‍යා සමාජය, ප්‍රවෘත්ති ලිපිය - කාණ්ඩ 4 නො.3 1987 සැප්තැම්බර්.

5.5.11 සාගරය විදීමේ ව්‍යාපෘතිය - 116 වැනි ගමන, ප්‍රාථමික ප්‍රතිඵල එන්.පී. විජයානන්ද මහතා ඇතුළු ජොයිඩීස් විද්‍යාත්මක කණ්ඩයම මගින්. ස්වභාවය - 1987 කාණ්ඩ 330 නො.6148

5.5.12 මුහුදු ලෙඩාය මනිනම්නුම් අඬු හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ සාගර විද්‍යාත්මක පර්යේෂණ වෙනුවෙන් ජාතෘකා ගතකල කෘතියක් ආචාර්ය වික්‍රමරත්න විසින් එක්සත් රාජධානියේ ප්‍රවුඩ්මන් සාගර විද්‍යාත්මක රසායනාගාරියේදී පිළිගන්වන ලදී.

5.5.13 ආචාර්ය වික්‍රමරත්න විසින් ශ්‍රී ලංකාවේ සමහර විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ සංස්කාරක සම්මේලනයක් ස්ක්‍රිප්ස් සමුද්‍ර ගර්භ ආයතනයේදී පවත්වන ලදී.

5.5.14 ඛනිජ වැලි කර්මාන්තය සඳහා නවමං ලංකා ඩේලි නිව්ස්, 1987 නොවැම්බර් ඩුලිප් ජයවර්ධන මහතා.

5.5.15 කල්පවත්නා සංවර්ධනය සඳහා ඛනිජ සම්පත්වල විද්‍යාත්මක ලෙස ප්‍රයෝජනයට ගැනීම, වාර්ෂික ශ්‍රී වි.ස. සැසිවාර 1987 දෙසැම්බර් ඩුලිප් ජයවර්ධන මහතා.

5.6 <u>උපකරණ</u>

පහත සඳහන් ද්‍රව්‍ය එ.ජා.ස.වැ. මාර්ගයෙන් සපයා ගන්නා ලදී.

1. ස්වයංක්‍රීය වාර්තා තබන විද්‍යුත් මීටරය.
2. මීටර 2 දිග පිස්ටන් කෝර
3. හයි රිසොලූෂන් ෂැලෝ සීස්මික් සිස්ටම් යුනිබූම්
4. ඉලෙක්ට්‍රෝනික් තුලනය.
5. චුම්බක විච්ඡේදකය
6. සාම්පල් ස්පිලිටර්.
7. අයි.බී.එම්. පී.සී. ඒ.ටී.පරිගණකය.
8. එච්.පී.මුද්‍රකය.

5.7 <u>බාධක.</u>

සමීක්ෂණයන්ට පෙර, පසුව හා සමීක්ෂණ කාලයතුල දී ඉලෙක්ට්‍රෝනික් උපකරණ නඩත්තු කිරීමේ තත්ත්වයක සිටින සුදුසුකම් ලැබූ ඉලෙක්ට්‍රෝනික් කාර්මික ශිල්පියෙකුගේ හිඟකම හේතුකොටගෙන සමුද්‍ර මාරු" මුහුදු ගමන් වැඩ සටහන නිරතුරුව ප්‍රමාදවිය.

1988 සඳහා අරමුණු කරගත් සවිස්තරාත්මක වැඩ සටහන සහ වැඩ කටයුතු විවිධාංගීකරණය අනුව පහත සඳහන් විශේෂ කරුණු සඳහා ඉක්මනින් සැලකිල්ල අවශ්‍යවේ.

1. වායු සමනය සමඟ රසායනාගාර ඉඩකඩ
2. අතිරේක කාර්ය මණ්ඩලය
   - ජීව [illegible] විද්‍යාඥයන් 1
   - භූ භෞතික විද්‍යාඥයන් 1
   - සමුද්‍ර භූ විද්‍යාඥයන් 1
   - ඉලෙක්ට්‍රෝනික් තාක්ෂණික ශිල්පීන් 1
3. කාර්යාල ඉඩකඩ

## 6.0 නාරා කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානය - කල්පිටිය.

### 6.1 සේවකයන්

1984 මැයි වලදී මෙම ස්ථානය ක්‍රියාත්මකවීම ආරම්භකල කාලයේ සිට ස්ථිර පර්යේෂණ නිලධාරීන් තිදෙනෙකු මෙයට සම්බන්ධවී සිටී. මෙම නිලධාරීන්ගේ ගොඩතර ජලජ සම්පත් ඒකකයෙන්වන අතර, අනෙක් තැනැත්තා ප්‍රධාන කාර්යාලයේ සමුද්‍ර ජීව විද්‍යාත්මක ඒකකයෙහි. 1987 කාර්ය මණ්ඩලයේ ප්‍රමාණය වෙනසක්වී නොතිබුණි.

මෙම ස්ථානයට සම්බන්ධ එක් පර්යේෂණ නිලධාරියෙකු පුහුණු වැඩසටහනක් වන 1987.11.11 දී නව මාසයක් සඳහා ජපානය බලා ගිය අතර, ස්ථානයේ තුඉතිරිවී සිටින්නේ එක් පර්යේෂණ සහායකයකු පමණි.

පසුගිය වර්ෂ දෙක සඳහා රසායනාගාර සේවකයන්/සහකරුවන් නොසිටි අතර, ඔවුන්ගේ කටයුතු සමඟ ක්ෂේත්‍ර සහයකයන්ගේද කටයුතු මෙම ස්ථානයට සම්බන්ධ අනියම් වැඩකරුවන් හතරදෙනෙකු විසින් දෛනික ගෙවීම් පදනම මත ඉටු කරනු ලැබේ.

### 6.2 කාර්ය වැඩ සටහන

ස්ථානය මඟින් භාරගත් පර්යේෂණ වැඩසටහන් ප්‍රධාන කාර්යාලයේ නොයෙක් අංශ යටතට වැටේ. එම නිසා මෙම ස්ථානයට සම්බන්ධ පර්යේෂණ නිලධාරීන්හට වෙන් වූ වාර්ෂික වාර්තා පිලියෙල කිරීම සහ ඒවා අදාල අංශ ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කිරීම අවශ්‍යවිය. නිලධාරීන්ට පෞද්ගලිකව සඳහන් කල නොහැකි කවරක්වුව ස්ථානයේ වාර්ෂික වාර්තා එක් ලෙස මෙහි ඉදිරිපත් කෙරේ.

6.3 කාර්ය මණ්ඩල පුහුණුවීම

එච්.එම්.එස්.පුෂ්පානන්ද මහතා ජලජීවී වගාව පිළිබඳ පුහුණු වැඩ සටහනක් හැදෑරීමපිණිස අසූ මසක කාල පරිච්ඡේදයක් සඳහා 1987.11.16 වන දින ජපානයට යවා ඇත.

6.4 දේශීය/විදේශීය සංස්කාරක සම්මේලනවැඩ මුළුවලදී කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය

අංශ ප්‍රධානීන් මාර්ගයෙන්එක් එක්නිලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව ඊගේ පිටපත් කරුණාකර බලන්න.

6.5 ප්‍රකාශන පත්‍රිකා කියවීම සහ වෙනත් වාර්තා.
ඉහත සඳහන් පරිදිය.

6.6 උපකරණ

කිසිත් නොමැත.

6.7 බාධක

සමහර මූලික ක්ෂේත්‍රීය උපකරණ හිඟබව. එනම්, කැමරාවක්, උෂ්ණයේ පිට මෝටරයක්, ස්කියුබා කිමිදුම් ආධාරක කට්ටලයක්, ක්ෂේත්‍රීය මෝටර් බයිසිකලයක් ආදිය නොමැතිවීමමධ්‍යස්ථානයේදී නොයෙක් ව්‍යාපෘති ක්‍රියා කිරීමේදී ඇති ප්‍රධාන බාධාවන්ගෙන් සමහරක් නම් රසායනාගාර සහ පුස්තකාල පහසුකම් ලබාගත නොහැකිවීමද මීට හේතුවිය.

